ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් ලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத மெதுர", காணி செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla.
☎ 011 279 7400
011 286 4051

මගේ අංකය / எனது இல / My No.
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 2021.02.09

චක්‍රලේඛ අංකය : 2021/01

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්
සියලුම ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්)
සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්
සියලුම සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්)

ඉඩම් නොමැති රණවිරුවන්ගේ පදිංචිය සඳහා රජයේ ඉඩම් ලබා දීම

ශ්‍රී ලංකාවේ [illegible] [illegible] ක්‍රියාත්මක [illegible] [illegible] දිවි පිදූ [illegible] පූර්ණ ආබාධිත වූ හා අර්ධ ආබාධිත වූ විශ්‍රාම ගොස් සිටින සහ දැනට සේවයේ සිටින ත්‍රිවිධ හමුදාවේ, පොලිස් දෙපාර්තමේන්තුවේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රණවිරුවන් සහ එවුන්ගේ යැපෙන්නන් [illegible] [illegible] [illegible] ප්‍රතිපත්තිය [illegible] [illegible] [illegible] ක්‍රියාත්මක කර ඇති අතර [illegible] [illegible] අමාත්‍ය මණ්ඩල තීරණ මගින් පදිංචිය සඳහා [illegible] ක්‍රමවේදයක් යටතේ ඉඩම් කොටසක් ලබා දීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක විය.

02. රණවිරුවන් සඳහා රජයේ ඉඩම් ලබාදීමේ වර්තමාන ප්‍රතිපත්තිය යටතේ ක්‍රියාත්මක වනුයේ 2016.07.18 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් ඉදිරිපත් කරන ලද සහනදායි ක්‍රමවේදයකි. එමගින් රණවිරුවන් සඳහා රජයේ ඉඩම් ලබාදීම සම්බන්ධව 2002.12.26 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට ලබා දී ඇති අනුමැතිය ක්‍රියාත්මක වී ඇති බැවින් හා 2016.07.18 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ (ඊ) IV අනුව 2016.08.30 දිනැති [illegible] ඉඩම් [illegible] [illegible] [illegible] රණවිරු [illegible] [illegible] [illegible] ප්‍රායෝගිකව ගැටළුකාරී විය. එබැවින් [illegible] [illegible] [illegible] රණවිරු [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] රණවිරුවන් [illegible] [illegible] සහනදායි ක්‍රමවේදය යටතේ පදිංචිය සඳහා ඉඩම් කොටසක් ලබා දීම සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමප/20/1616/322/003 හා 2020.10.13 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට 2020.11.17 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවී ඇත.

03. එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, රණවිරුවන් සඳහා ඉඩම් ලබා දීමේ දී අනුගමනය කළ යුතු සහනදායි ක්‍රමවේදය පිළිබඳ උපදෙස් ලබා දීමේ අවශ්‍යතාව මත මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

I කොටස

ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබන රණවිරු කාණ්ඩ

2009.06.01 දිනට පෙර සේවයට බැඳී ඇති සක්‍රීයව ඉවත්වීමක් නොමැති ශ්‍රී ලංකා යුද්ධ හමුදාව /නාවික හමුදාව/ගුවන් හමුදාව/ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රණවිරුවන් හා ඔවුන්ගෙන් යැපෙන්නන් මෙම රණවිරු ප්‍රතිලාභ යටතේ ආවරණය වේ.

පළමු කාණ්ඩය

1. ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී මියගිය රණවිරුවන්ගේ පවුලේ ළඟම ඥාතීන්ට (විවාහක නම් කලත්‍රයාට කලත්‍රයා නොමැති නම් අවිවාහක දරුවන්ට / අවිවාහක නම් මව හෝ පියා)
2. ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී අතුරුදන් වූ රණවිරුවන්ගේ පවුලේ ළඟම ඥාතීන්ට (විවාහක නම් කලත්‍රයාට කලත්‍රයා නොමැති නම් අවිවාහක දරුවන්ට / අවිවාහක නම් මව හෝ පියා)
3. ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වූ රණවිරුවන්ට

දෙවන කාණ්ඩය

1. ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී අර්ධ ආබාධිත තත්ත්වයට පත් වූ රණවිරුවන්ට
2. ක්‍රියාන්විත නොවන හේතූන් නිසා මියගිය රණවිරුවන්ගේ පවුලේ ළඟම ඥාතීන්ට (විවාහක නම් කලත්‍රයාට කලත්‍රයා නොමැති නම් අවිවාහක දරුවන්ට / අවිවාහක නම් මව හෝ පියා)
3. ක්‍රියාන්විත සේවයේ යෙදී සිට විශ්‍රාම ගිය රණවිරුවන්ට
4. දැනට සේවයේ යෙදී සිටින රණවිරුවන්ට

II කොටස

ප්‍රතිලාභ හිමිවන ආකාරය

(අ) ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබන රණවිරු කාණ්ඩ අනුවින් I කොටසෙහි පළමු කාණ්ඩය යටතට අයත්වන රණවිරුවන් / ඔවුන්ගේ ළඟම ඥාතීන්ට රජයේ ඉඩම් ආඥා පනතේ 6 වගන්තිය අනුව ගෙවීම් අයකිරීමෙන් තොරව දීමනා පත්‍රයක් ලබා දිය යුතුය. දීමනා පත්‍රය නිකුත් කරන තෙක් එම ඉඩමට පිවිසීමට පූර්වය වීම සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝකාලීන බදු අනුමැතියක් ලබා දිය යුතු හෙයින්, ඒ සඳහා පහත සඳහන් නිර්දේශ වාර්තා සමග ඉඩම් කොමසාරිස් / [illegible] මඟින් (ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්) මඟින් මා වෙත එවීමට කටයුතු කරන්න.

- ඉල්ලීම් ලිපිය
- 19 පරිශිෂ්ට වාර්තාව
- [illegible] වාර්තාව
- [illegible] බවට දිවුරුම් ප්‍රකාශය
- 17 පරිශිෂ්ට වාර්තාව
- [illegible]
- [illegible] ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ සහතික කළ පිටපතක්
- විවාහක රණවිරුවකු නම්, විවාහ සහතිකයේ සහතික කළ පිටපතක්